අලයාඩි වේම්බු ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අලයාඩි වේම්බු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
--------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කළයුතු වූවද එසේ මුදල ප්‍රවාහ ප්‍රකාෂ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

(අ) සභාවේ ස්ථාවර තැන්පත් ගිණුම් 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබියයුතු පොලි ආදායම් රු. 3,374,493 ක් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ තිබූ විදුලි උපකරණ වර්ග 09 තොහයෙ හි වටිනාකම රු. 149,190 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මස් කඩ බදුගත් බදුකරුවන්ගෙන් අයවියයුතු රු. 698,400 ක බදු මුදල ආදායම් ගිණුමට මාරු නොකර තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ඈ) 2014 වර්ෂයේදී පරිසර ආරක්ෂාව පිළිබද මහජනතාවගෙන් අයකරගත් රු. 38,000 ක මුදල 2015 ජූනි 16 දින දක්වා ආදායම් ගිණුමට මාරු නොකර තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ඉ) සේවකයන්ගෙන් අයකරගත් රු. 43,153 ක ණය වාරික සහ පොලිය අදාල ගිණුම්වලට ගැලපීම් නොකර ආදායම් ගිණුමේ දක්වා තිබුණි.

1.3.4 ලැබියයුතු ගිණුම්
------------------

මියගිය නිලධාරියෙකුගෙන් අයවියයුතු රු. 39,900 ක සේවක ණය ශේෂය ඔහුගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණන සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක්එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 157,949,871 | ඉඩම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 212,166 | |
| මොටර් වාහන සහ කරත්ත | 1,871,290 | ස්ථාවර වත්කම් ලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලීබඩු සහ සවි කිරීම් | 1,390,525 | |
| පුස්තකාල පොත් | 667,192 | |

1.3.6 නීති, රීති , රෙගුලාසි සහ කළමනාකරණ ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දින භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝණක 12 සහ පරිඝණක උපකරණ මෘදුකාංග සටහන් කිරීම සඳහා පරිඝණක ලේඛනයක් පවත්වා තොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගත්තිය 180 | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත් අත්සන් කිරීම යන චෙක්පත් අත්සන් කිරීම යන රාජකාරි නිලධාරින් තිදෙනෙකුට පරිපාලනමය පවරා තිබුණද ඔවුන්ගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදී ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය X වගත්තිය 193 | සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය ලේඛනය සමග සසදා විචලනයන් සඳහා හේතු සමඟ ප්‍රකාශනයක් සකස්කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) පරිච්ඡේදය X වගන්තිය 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 396 | ඉකුත් මාස 18 ක කාලයතුල මුදල් නොකළ චෙක්පත් 03 ක රු. 1,580 ක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 4,912,891 ක් වූ අතර, එය සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 3,523,676 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 1,389,215 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
------------------------------------

2.2.1 වරිපනම් හා බදු
------------------

1989 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම්, ඉදිකරන ලද නිවාස ගොඩනැගිලි වලින් වරිපනම් අයකිරීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්
------------------

(අ) රෝලර් යන්ත්‍රයේ බදු ආදායම්
--------------------------------

සභා තීරණය අනුව රෝලර් යන්ත්‍රවල දෛනික බදු කුලි රු. 7,000 හෝ ආර්ථික බදුකුලි රු. 3,500 ක් අය කළයුතු වුවද අවස්ථා 06 කදී ආර්ථික කුලිය අයකර නොකිරීම නිසා රු. 15,500 ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) ප්‍රචාරක දැන්වීම් පුවරු සහ සංනිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම
--------------------------------------------------------------------------

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව සභාව විසින් ආදායම් අය කරීම් සඳහා අදාල අතුරු ව්‍යවස්ථා පනවීමට අපොහොසත් වීම නිසා සභා බල ප්‍රදේශයේ පුද්ගලික ආයතන වලින් ස්ථාපිත කරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 03 ක් සඳහා සහ 2009 සිට 2014 දක්වාවූ කාල පරිච්ඡේදයයේ ඉදිකරන ලද සංනිවේදන කුළුනු 02 ක් වෙනුවෙන් අයවියයුතු බලපත්‍ර ගාස්තු රු. 170,000 ක මුදල 2015 ජුනි 12 වන දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 හිඟ ආදායම්
-------------

(අ) 1988 සිට 2012 වර්ෂය දක්වා හිඟ මස්කඩ කුලි රු. 526,318 ක් අය කර ගැනීමට හෝ බදු කරුවන්ට විරුද්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2002 සිට 2007 දක්වා හිඟව තිබූ ව්‍යාපාර බදු රු. 16,680 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ දුර්වලතා
----------------------------

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ

(අ) සභා පුස්තකාලයේ සවිකර තිබූ ජාතික ජලසම්පාදන හා ජල පවාහන මණ්ඩලයේ ජල මනුව ප්‍රයෝජනයටගෙන මගින් මහජනතාව වෙත පානිය ජලය නිකුත් කිරීමෙන් සභාවට රු. 69,310 ක ආදායමක් ලැබී තිබුණද, එම ජලය සඳහා ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයට ජල ගාස්තු වශයෙන් රු. 101,406 ක්වූ ගෙවා තිබීමේ හේතුවෙන් සභාවට රු. 32,096 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මන්ත්‍රිවරුන් විසින් ග්‍රාමීය මාර්ග 38 ක් අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම් සහ ටෙන්ටර් ක්‍රියා පරිපාටි අනුගමනය කිරීමකින් තොරව රු. 449,600 ක් වැයකර තිබුණි.

(ඇ) නිලධාරින් 07 ක් ලබාගත් විවිධ ණය එකතුව රු. 114,573 ක් වර්ෂ 02 සිට වර්ෂ 08 ක කාලයක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා භාවිතා කිරීමට රු. 499,850 ක මුදලට ප්ලාස්ටික් බාල්දී මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂය විය.

  (i) ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමන නොකර මේවා මිලදී ගෙන තිබුණි.

  (ii) භාණ්ඩ ලැබුණු බවට ගබඩා ලේඛනවල සටහන් කර නොතිබුණි.

  (iii) බාල්දී 760 මිලදි ගෙන තිබුණද එවා බෙදා හැරීම් පිළිබඳ සනාථ කිරීම සඳහා සභාව විසින් ලිපිලේඛන කිසිවත් නඩත්තු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
----------------------------

ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ ජාතික වැඩසටහන
----------------------------------------------------

පළාත් පාලන, පළාත් සභා අමාත්‍යාංශයේ අංක 1/2014 දරණ චක්‍රලේඛය අනුව අලයාඩිවේම්පු ප්‍රාදේශීය සභාව විසින් තෝරාගත් ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් රු. 4,000,000 ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත අරමුදල යොදවා සමාලෝචිත වර්ෂයේදී ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය නොකර ධර්මසංගරි ක්‍රීඩා පිටිය, ළමා උද්‍යානය, වාහන නැවතුම්පොල යන ඉදිකිරීම් කර තිබුණි.

(ආ) ඉහත අරමුදල යොදවා ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර් ටේලර් 04 ක් රු. 999,875 වැයකර අළුත්වැඩියා කර තිබුණි. ටේලර් යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා තාක්ෂණ ඇගයීම් වාර්තා ලබාගෙන නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් මෙම සංවර්ධන කාර්යන් ඉටුකිරීම් සඳහා රු. 4,000,000 ක් ලබාදී තිබුණද, එම අරමුදල අදාල කාලයතුල ප්රයෝජනයට නොගැනීම නිසා රු. 1,682,149 ක මුදලක් ආපසු යවා තිබුණි.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය
--------------------------------

2011 වර්ෂයේ දී UNOPS වැඩ සටහන් යටතේ කන්නකිපුරම්හි ඉදිකරන ලද ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිය ක්‍රමය යටතේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ආයතනය අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී නොගැනීම නිසා ඉදිකරන ලද කාලයේ සිට නිෂ්කාර්යව පැවතුනි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගත යුතු බව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 වන දින අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරණය පිළිබඳ චක්‍රලේඛයේ 8 වන ඡේදයෙන් පෙන්වා දී තිබූ පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඉ) අයවැය පාලනය